**කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය**

**கமத்தொழில், காணி, கால்நடை, நீர்ப்பாசன, மீன்பிடி மற்றும் நீரியல்வளங்கள் அமைச்சு**

**Ministry of Agriculture, Lands, Livestock, Irrigation, Fisheries and Aquatic Resources**

**කෘෂිකර්ම අංශය / விவசாயப் பிரிவு / Agriculture Division**

80/5 ,"ගොවිජන මන්දිරය", රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

80/5, "கொவிஜன மந்திரய",ரஜமல்வத்தை ஒழுங்கை,பத்தரமுல்லை, இலங்கை.

80/5 ,"Govijana Mandiraya", Rajamalwatta Lane, Battaramulla, Sri Lanka.

---

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය.<br>எனது இல.<br>My No. | Fert/Dev/3/09/04 –<br>2024 / 25 මහ මාර්ගෝපදේශය | ඔබේ අංකය.<br>உமது இல.<br>Your No. | | දිනය.<br>திகதி.<br>Date. | 2024.10. 30 |

**<u>අමාත්‍ය මණ්ඩල තීරණ ක්‍රියාත්මක කිරීම.</u>**

## 2024 /25 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම්වල වෙනත් බෝග වගා කරන ගොවීන් වෙත මූල්‍ය සහනාධාරය ලබා දීම සඳහා වූ වැඩපිළිවෙලට අදාල මාර්ගෝපදේශය

### 1. සහනාධාර ප්‍රතිපත්තිය

1.1 "2024/25 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම් වල වගා කරන ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීම" යන මැයෙන් කෘෂිකර්ම සහ වැවිලි කර්මාන්ත ඇමතිතුමා ඉදිරිපත් කළ අමප අංක 24/ 1599/612/074 හා 2024.08.08 දිනැති අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2024.08.21 දිනැති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී ලබා දී ඇති තීරණය අනුව 2024/25 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම්වල සිදු කරන වී වගාව සහ කන්න රැස්වීම්වල තීරණ අනුව සිදු කරන වෙනත් වගාවන් සඳහා එක් ගොවියෙකුට වගා කරන ලද උපරිම හෙක්ටයාර දෙකක් සඳහා හෙක්ටයාරයකට රු.15,000.00 බැගින් මුදලක් මූල්‍ය සහනාධාරයක් ලෙස ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ලබා දීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව, එකී 2024/25 මහ කන්නයේ කුඹුරු ඉඩම් වල වගා කිරීමට නිර්දේශිත වෙනත් බෝග නිර්දේශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DOA/PA/12/1/ETC හා 2024.10.18 දිනැති ලිපිය මඟින් ලබා දී ඇති අතර, එම බෝග වනුයේ, බඩ ඉරිඟු, කව්පි, රට කජු, මුං, සෝයා, මිරිස්, කුරක්කන්, උඳු, බතල සහ එළවළු ය. (ඇමුණුම 01)

1.2 ඒ අනුව, 2024/25 මහ කන්නයේදී, ගොවියාට හිමි දිවයිනේ කවර හෝ ප්‍රදේශයක හෝ ප්‍රදේශයන්හි පිහිටා ඇති, වෙනත් බෝග වගාකරන කුඹුරු හෙක්ටයාර් 02 ක උපරිම ප්‍රමාණයක් දක්වා පමණක් හෙක්ටයාර 01ක් සඳහා රු.15,000/- බැඟින් වන සේ, හෙක්ටයාර් 02ක් දක්වා රු.30,000/-ක උපරිම මුදලක්, එක් ගොවියෙකුට, ඉහත 1.1 හි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ



ලේකම් කාර්යාලය දුරකථන தொலைபேசி Telephone - 011-2034301
செயலாளர் அலுவலகம் ඊ-මේල් மின்னஞ்சல் e-mail - secretary@agrimin.gov.lk
Secretary Office ෆැක්ස් தொலைநகல் Fax - 011-2863497

පොදු பொது General දුරකථන தொலைபேசி Telephone - 011-2034300
ඊ-මේල් மின்னஞ்சல் e-mail - info@agrimin.gov.lk
ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910

පිළිතුරු ලිපි යොමු කිරීමේදී මගේ අංකය, ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි සඳහන් කර එවීමට කාරුණික වන්න

අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශිත බෝග සඳහා පොහොර ලබා ගැනීම සම්බන්ධයෙන් මූල්‍ය සහනාධාරයක් ලබා ගැනීමට හිමිකම ලැබී ඇති අතර, මෙකී මුදල් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත ප්‍රේෂණය කිරීමේ වගකීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත පවරා දී ඇත.

2. <u>වෙනත් බෝග සඳහා වූ මාර්ගෝපදේශය ක්‍රියාත්මක කිරීමේ ආයතනික වගකීම් හා කාර්යභාරය සහ අධීක්ෂණය</u>

මගේ අංක Fert/Dev/3/09/04 - 2024 / 25 මහ මාර්ගෝපදේශය හා 2024.09.10 දිනැතිව නිකුත් කළ "2024 /25 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම්වල වී වගා කරන ගොවීන් වෙත මූල්‍ය සහනාධාරය ලබා දීම සඳහා වූ වැඩපිළිවෙලට අදාල මාර්ගෝපදේශය" හි අංක 2 සිට 8 දක්වා නිකුත් කර ඇති උපදෙස් මෙම මාර්ගෝපදේශයේ උපදෙස් අංක 1.1 හි මූල්‍යාධාර සීමාවට යටත්ව මේ සම්බන්ධව අදාළ කර ගත යුතුය.

එම්.පී.එන්.එම්. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය

<u>පිටපත්</u> :

1) ජනාධිපති ලේකම්, ජනාධිපති ලේකම් කාර්යාලය
2) අග්‍රාමාත්‍ය ලේකම්, අග්‍රාමාත්‍ය ලේකම් කාර්යාලය
3) විගණකාධිපති
4) ලේකම්, මුදල් ආර්ථික සංවර්ධන,ප්‍රතිපත්ති සම්පාදන, සැලසුම් සහ සංචාරක අමාත්‍යාංශය
5) ලේකම්, අධිකරණ,රාජ්‍ය පරිපාලන,ස්වදේශ කටයුතු,පළාත් සභා,පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
6) සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන්
7) සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්
8) අධ්‍යක්ෂ ජනරාල්, ජාතික අයවැය දෙපාර්තමේන්තුව
9) අධ්‍යක්ෂ ජනරාල්, සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව
10) අධ්‍යක්ෂ ජනරාල්, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව
11) ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්,ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව
12) අධ්‍යක්ෂ ජනරාල්,මහවැලි අධිකාරිය
13) අධ්‍යක්ෂ ජනරාල්, භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව
14) සියලුම අතිරේක ලේකම්වරුන් / අධ්‍යක්ෂ ජනරාල්වරුන්, කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (කෘෂිකර්ම අංශය)
15) ප්‍රධාන මූල්‍ය නිලධාරි, කෘෂිකර්ම අමාත්‍යාංශය කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (කෘෂිකර්ම අංශය)
16) අධ්‍යක්ෂ,ජාතික පොහොර ලේකම් කාර්යාලය
17) සභාපති, ස්ටේට් ෆර්ටිලයිසර් කම්පැණි ලිමිටඩ්
18) සභාපති, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය
19) මෙම වැඩපිළිවෙලට දායක වන බැංකු වල සභාපතිවරුන්
20) ප්‍රධාන අභ්‍යන්තර විගණක, කෘෂිකර්ම, ඉඩම්, පශු සම්පත්, වාරිමාර්ග, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය (කෘෂිකර්ම අංශය)

ඇමුණුම 01

**<u>2024/25 මහ කන්නය සඳහා කුඹුරු ඉඩම් වල වෙනත් බෝග වගා කරන ගොවීන් සඳහා පොහොර සහනාධාරය ලබා දීම.</u>**

| ඒකකය | 2024/25 මහ කන්නයේ කුඹුරු ඉඩම් වල වගා කරන අතිරේක ආහාර බෝග වර්ග | 2024/25 මහ කන්නය කුඹුරු ඉඩම් වල වගා කරන අතිරේක ආහාර බෝග වගා කිරීමට එකඟ වී ඇති වගා ඉලක්ක (ha) |
|---|---|---|
| උතුරු පළාත | - | - |
| උතුරු මැද පළාත | - | - |
| මධ්‍යම පළාත | - | - |
| සබරගමුව පළාත | - | |
| දකුණු පළාත | - | - |
| බස්නාහිර පළාත | - | - |
| ඌව පළාත | බඩ ඉරිඟු,කව්පි,රට කජු | 200 |
| නැගෙනහිර පළාත | - | - |
| වයඹ පළාත | - | - |
| අන්තර් පළාත් බල ප්‍රදේශ-හසලක | බඩ ඉරිඟු | 330 |
| මහවැලි බල ප්‍රදේශ<br><br>වී වගා වලට ප්‍රමාණවත් ජලය නොමැති අවස්ථාවක් පැමිණියහොත් පමණක් වී වෙනුවට මෙම බෝග ඉදිරි වසරේ ජනවාරි අවසන් සතියේ සිට වගා කිරීමට අපේක්ෂා කෙරේ. | මුං | 27 |
| | කව්පි | 29 |
| | සෝයා | 50 |
| | රටකජු | 118 |
| | මිරිස් | 139 |
| | කුරක්කන් | 27 |
| | උඳු | 23 |
| | බතල | 150 |
| | බඩ ඉරිඟු | 430 |
| | එළවළු | 500 |

(මූලාශ්‍රය - කෘෂිකර්ම අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක DOA/ PA/ 12/ 1/ ETC හා 2024.10.18 දිනැති ලිපිය)